**2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත**
**8 වන වගන්තිය - අර්ධ වාර්ෂික වාර්තාව**

**පළමු කොටස**
වර්ෂය 2026 වාර්තාව අදාළ කාලය 2026.01.01 දින සිට 2026.06.30 දින දක්වා

**01. අමාත්‍යාංශ තොරතුරු**

I. අමාත්‍යාංශයේ නම :- මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
II. (පළාත් සභා අමාත්‍යාංශ වන කල්හි පළාත) : -
III. ලිපිනය :- මහා භාණ්ඩාගාරය, කොළඹ 01
IV.දුරකථන අංක (පොදු) : - 011-2484637
V. විද්‍යුත් තැපැල :- dgpf@pfd.treasury.lk
VI.වෙබ් අඩවිය :- www.treasury.gov.lk

**02. අමාත්‍යාංශයේ කාර්ය සංවිධානය ව්‍යුහය**

- සංවිධාන සටහනකින් දක්වන්න (ඇමුණුම 01)
- අංශ, අංශ ප්‍රධානී නිල නාම, මාණ්ඩලික නිලධාරි තනතුරු හා වෙනත් මුලු සේවක සංඛ්‍යාව එහි ඇතුළත් විය යුතුය.

**03. අමාත්‍යාංශයේ කර්තව්‍ය හා ක්‍රියාකාරකම් (අංශ / ශාඛා අනුව)**

| අංශය / ශාඛාව | ප්‍රධාන කර්තව්‍යයන් / ක්‍රියාකාරකම් සැකෙවින් | සම්බන්ධිත දුරකථන අංක |
|---|---|---|
| මුදල් රෙගුලාසි, පසුවිපරම් හා සමාලෝචන සහ අරමුදල් අංශය | ➢ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ භාවිතයන් සකස් කිරීම, සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම, සමාලෝචනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම් කිරීම.<br>➢ රාජ්‍ය ආයතනවල කාර්යයන් පරීක්ෂා කිරීමේදී රාජ්‍ය ගිණුම් කාරක සභාවට සහාය වීම සහ භාණ්ඩාගාර සටහන් නිකුත් කිරීම ඇතුළු රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසුවිපරම් ක්‍රියාමාර්ග ගැනීම.<br>➢ විගණකාධිපතිවරයාගේ වාර්තා සහ විගණන විමසුම් අනුව පසුවිපරම් ක්‍රියාමාර්ග ගැනීම.<br>➢ දෙපාර්තමේන්තු ගාස්තු සහ අයකිරීම් සමාලෝචනය කර අවශ්‍ය විට සංශෝධන යෝජනා කිරීම.<br>➢ මුදල් රෙගුලාසි 104 සහ 113 ප්‍රකාරව කපා හැරීම් සහ අත්හැරීම් සඳහා වන ඉල්ලීම් පරීක්ෂා කිරීම. විවිධ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු යටතේ පවත්වාගෙන යනු ලබන අරමුදල්වල ක්‍රියාකාරිත්වය සමාලෝචනය සහ අධීක්ෂණය.<br>➢ විදේශ තානාපති කාර්යාල සහ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල විසින්, තීරු බදු රහිතව මෙරටට ආනයනය කරන ලද වාහන අපහරණය කිරීම සම්බන්ධයෙන් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රේගුව සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කරගනිමින් අවශ්‍ය කටයුතු සිදු කිරීම.<br>➢ රජයේ මූල්‍ය දැක්ම තුළ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ කාර්යයන්ට සහාය වීම. | 011-2484637 |

| | | |
|---|---|---|
| ඉඩම් අංශය | ➢ අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කරනු ලබන ඉඩම් අංශයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා දෙපාර්තමේන්තුවට අදාල විෂය පථයන් සම්බන්ධයෙන් වන නිරීක්ෂණ මුදල් අමාත්‍යවරයා වෙත ලබා දීම. | 011-2484636 |
| ප්‍රසම්පාදන අංශය | ➢ අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා දෙපාර්තමේන්තුවට අදාල විෂය පථයන් සම්බන්ධයෙන් වන නිරීක්ෂණ මුදල් අමාත්‍යවරයා වෙත ලබා දීම<br>➢ රාජ්‍ය ප්‍රසම්පාදනයේදී මුදලට සරිලන වටිනාකම, විවෘත හා ඵලදායී තරඟකාරිත්වය, ආචාරධර්ම සහ සාධාරණ ගනුදෙනු, විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා භාණ්ඩ, වැඩ සහ උපදේශන සේවා ප්‍රසම්පාදනය සඳහා රජයේ ප්‍රසම්පාදන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජාතික ප්‍රසම්ප්‍රදන කොමිසමට සහාය වීම සහ අවශ්‍ය නිර්දේශ ලබාදීම<br>➢ ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටු හා එයට සහාය වන ලංසු ඇගයීමේ කමිටු පත් කිරීම<br>➢ රාජ්‍ය ආයතනවල ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම | 011-2154000 |
| පාලන, ධාරිතා සංවර්ධන සහ පුහුණු අංශය | ➢ සියලු නිලධාරින්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු රාජකාරි<br>➢ දෙපාර්තමේන්තු වෙත ලැබෙන ලිපි සහ යැවෙන ලිපි සම්බන්ධ රාජකාරි<br>➢ නිලධාරින්ගේ නිවාඩු,දුම්රිය බලපත්‍ර ඇතුලු ආයතනික කටයුතු<br>➢ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කාර්යයන්, නඩත්තු සහ සේවා කටයුතු<br>➢ දෙපාර්තමේන්ත ප්‍රවාහන විෂය රාජකාරි සහ වාහන නඩත්තු රාජකාරි<br>➢ දෙපාර්තමේන්තු නිලධාරින්ගේ  පුහුණු සහ ධාරිතා  සංවර්ධන අවශ්‍යතා සම්බන්ධ රාජකාරි | 011-2484797 |
| විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන අංශය | ➢ විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියට (e-GP) අදාළ සංවර්ධන කටයුතු සිදු කිරීම | 011-2484805 |
| ගිණුම් අංශය | ➢ දෙපාර්තමේන්තුවේ ගෙවන නිලධරියෙකු ලෙස රාජකාරි ඉටු කරමින් මූල්‍ය කටයුතු පාලනය කිරීම<br>➢ මුදල් / චෙක්පත් ලැබීම් නිසි ලෙස සටහන් කිරීම, බැංකුගත කිරීම සහ ආරක්ෂා කිරීම.<br>➢ වවුචර් සහතික කිරීම, වියදම් ලෙජරය නඩත්තු කිරීම.<br>➢ ITMIS, CIGAS සහ GPS පද්ධති මඟින් මූල්‍ය තොරතුරු සැකසීම සහ වාර්තාකරණය කිරීම.<br>➢ දෙපාර්තමේන්තුවේ නිල බැංකු කටයුතු අධීක්ෂණය සහ පවත්වාගෙන යාම, බැංකු ගිණුම් මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම.<br>➢ රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් B ගිණුමට අදාළ කටයුතු පවත්වාගෙන යාම, වාර්තා පවත්වාගෙන යාම, වැටුප් ගණනය කිරීම සහ වැටුප් ගෙවීම් සැකසීම. | 011-2034448 |

| | | |
|---|---|---|
| | ➢ අග්‍රිම අරමුදල් ගිණුම සකස් කිරීම, කළමනාකරණය කිරීම සහ පවත්වාගෙන යාම.<br>➢ මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කිරීම, අවශ්‍ය සැසඳුම් සිදු කිරීම සහ මෙම කටයුතු අධීක්ෂණය කිරීම.<br>➢ විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම.<br>➢ ස්ථාවර වත්කම් ලේඛන සහ ඉන්වෙන්ටරි ලේඛන පවත්වාගෙන යාම. | |

**04.** අමාත්‍යාංශ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේදී නියමිත කාර්යය පටිපාටි හා සම්මතයන්

| කාර්යය / කර්තව්‍යයන් | කාර්යයන් / කර්තව්‍යයන් හා සම්මතයන් අඩංගු වන ලිඛිත නීති රෙගුලාසි සඳහන් වන පනත් / රීති / නියෝග / රෙගුලාසි /මාර්ගෝපදේශ / චක්‍ර ලේඛන / අත්පොත් හා වෙනත් වාර්තා ලැයිස්තුව | වාර්තාවල තොරතුරු ලබාගත හැකි වෙබ් අඩවිය. |
|---|---|---|
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ භාවිතයන් සකස් කිරීම, සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම, සමාලෝචනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම් කිරීම. | 2024 අංක 44 දරණ රාජ්‍ය මුදල් කළමනාකරණ පනත<br>1992 මුදල් රෙගුලාසි සංග්‍රහය<br>රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක, 01/2020 , 02/2020 , 01/2020(i), 01/2020(ii) , 01/2020(iii) , 01/2020(iv), 02/2023 , 03/2023, 01/2024, 01/2024(i) , 02/2024, 03/2024, 02/2025 | www.treasury.gov.lk |
| රාජ්‍ය ආයතනවල කාර්යයන් පරීක්ෂා කිරීමේදී රාජ්‍ය ගිණුම් කාරක සභාවට සහාය වීම සහ භාණ්ඩාගාර සටහන් නිකුත් කිරීම ඇතුළු රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසුවිපරම් ක්‍රියාමාර්ග ගැනීම. | | |
| විගණකාධිපතිවරයාගේ වාර්තා සහ විගණන විමසුම් අනුව පසුවිපරම් ක්‍රියාමාර්ග ගැනීම. | මු.රෙ. 155 | |
| දෙපාර්තමේන්තු ගාස්තු සහ අයකිරීම් සමාලෝචනය කර අවශ්‍ය විට සංශෝධන යෝජනා කිරීම. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020(iii) | www.treasury.gov.lk |
| මුදල් රෙගුලාසි 104 සහ 113 ප්‍රකාරව කපා හැරීම් සහ අත්හැරීම් සඳහා වන ඉල්ලීම් පරීක්ෂා කිරීම. | මු. රෙ. 127(7) , 128(ඉ)(ජ),<br>මු. රෙ. 101 – 113<br>රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 , 01/2024 , 02/2024 | www.treasury.gov.lk |
| විවිධ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු යටතේ පවත්වාගෙන යනු ලබන අරමුදල්වල ක්‍රියාකාරිත්වය සමාලෝචනය සහ අධීක්ෂණය. | 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත<br>අංක 01/2020 හා 2020.08.20 දිනැති චක්‍රලේඛය,<br>අංක 04/2024 හා 2024.11.06 දිනැති චක්‍රලේඛය,<br>අංක 01/2025 හා 2025.02.28 දිනැති චක්‍රලේඛය, | www.treasury.gov.lk |

| | | |
|---|---|---|
| අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා දෙපාර්තමේන්තුවට අදාල විෂයපථයන් සම්බන්ධයෙන් වන නිරීක්ෂණ මුදල් අමාත්‍යවරයා වෙත ලබා දීම | | www.treasury.gov.lk |
| රාජ්‍ය ප්‍රසම්පාදනයේදී මුදලට සරිලන වටිනාකම, විවෘත හා ඵලදායී තරඟකාරිත්වය, ආචාරධර්ම සහ සාධාරණ ගනුදෙනු, විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා භාණ්ඩ, වැඩ සහ උපදේශන සේවා ප්‍රසම්පාදනය සඳහා රජයේ ප්‍රසම්පාදන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජාතික ප්‍රසම්පාදන කොමිසමට සහාය වීම සහ අවශ්‍ය නිර්දේශ ලබාදීම | භාණ්ඩ, වැඩ හා උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ අත්පොත -2024 උපදේශකයින් තෝරා ගැනීම සහ සේවයේ යෙදවීම පිළිබඳ මාර්ගෝපදේශය - 2007, රජයේ ටෙන්ඩර් පටිපාටිය - 1998, II කොටස සහ 02/2019 රාජ්‍ය මුදල් චක්‍රලේඛය | www.treasury.gov.lk https://nprocom.gov.lk/ |
| ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටු හා එයට සහාය වන ලංසු ඇගයීමේ කමිටු පත් කිරීම | භාණ්ඩ, වැඩ හා උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ අත්පොත -2024 උපදේශකයින් තෝරා ගැනීම සහ සේවයේ යෙදවීම පිළිබඳ මාර්ගෝපදේශය - 2007, රජයේ ටෙන්ඩර් පටිපාටිය - 1998, II කොටස සහ 02/2019 රාජ්‍ය මුදල් චක්‍රලේඛය | www.treasury.gov.lk https://nprocom.gov.lk |
| රාජ්‍ය ආයතනවල ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම | | |
| විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියට (e-GP) අදාළ සංවර්ධන කටයුතු සිදු කිරීම | විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශය නිකුත් කිරීමට නියමිතව ඇත. | www.promise.lk |
| විදේශ තානාපති කාර්යාල සහ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල විසින්, තීරු බදු රහිතව මෙරටට ආනයනය කරන ලද වාහන අපහරණය කිරීම සම්බන්ධයෙන් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රේගුව සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කරගනිමින් අවශ්‍ය කටයුතු සිදු කිරීම. | විදේශ කටයුතු , විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ 1992.08.13 දිනැති අංක 2/92 දරණ චක්‍රලේඛය | www.mfa.gov.lk |
| රජයේ මූල්‍ය දැක්ම තුළ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ කාර්යයන්ට සහාය වීම. | 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත | www.treasury.gov.lk |

<u>**දෙවන කොටස**</u>

**05.** අමාත්‍යාංශය යටතේ වන පොදු අධිකාරීන්වල තොරතුරු

| පොදු අධිකාරියේ නම | ලිපිනය | දුරකථන අංක (පොදු ) | වෙබ් අඩ විය | විද්‍යුත් තැපැල | තොරතුරු නිලධාරි නම තනතුර දුරකථන අංකය |
|---|---|---|---|---|---|
| | | | | | |

**06.** **අමාත්‍යාංශය හා එක් එක් පොදු අධිකාරියෙහි ප්‍රධාන විධායකයින්, කාර්යයන් හා කර්තව්‍යයන්**
(අමාත්‍යාංශයට හා එක් එක් ආයතනයට වෙන වෙනම සටහන් යොදන්න)

1. පොදු අධිකාරියේ නම :-

11. තනතුරු අනුව බලතල කාර්යය හා කතව්‍යය

| ප්‍රධාන තනතුරු | තනතුරට පැවරෙන බලතල, කාර්යය හා කර්තව්‍යයන් (සැකෙවින්) |
|---|---|
| රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් | • රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත සහ ඒ සම්බන්ධ රෙගුලාසි සකස් කිරීමේදී භාණ්ඩාගාර ලේකම්වරයා (ST) වෙත සහාය ලබාදීම.<br>• අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ කරුණු නිරීක්ෂණය හා අධීක්ෂණය කිරීම.<br>• අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල කාර්යසාධනය සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් කාරක සභාව (COPA) විසින් සිදුකරන විමර්ශන සඳහා සහාය ලබාදීම.<br>• ගරු මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් කැබිනට් පත්‍රිකා සඳහා නිරීක්ෂණ සකස් කිරීම සහ මුදල් අමාත්‍යාංශයට අදාළ කැබිනට් පත්‍රිකා කෙටුම්පත් කර කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා භාණ්ඩාගාර ලේකම්වරයාට (ST) සහාය ලබාදීම.<br>• අවශ්‍ය වන සෑම අවස්ථාවකදීම රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ අනෙකුත් කාරණාවලදී ගරු මුදල් අමාත්‍යවරයාට සහ භාණ්ඩාගාර ලේකම්වරයාට (ST) සහාය ලබාදීම.<br>• භාණ්ඩාගාර නියෝජිතයා ලෙස කටයුතු කරමින් රජයට අයත් ආයතන වෙත සහාය ලබාදීම. |
| රාජ්‍ය මුදල් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (විද්‍යුත් ප්‍රසම්පාදන) | • රජයේ ආයතනවල ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් පිළිබඳ දත්ත සමුදායක් (Database) නිර්මාණය කිරීම, පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම.<br>• ඉලෙක්ට්‍රොනික රජයේ ප්‍රසම්පාදන (e-GP) පද්ධතියට අදාළ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම. |
| රාජ්‍ය මුදල් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රසම්පාදන) | • භාණ්ඩ, ඉදිකිරීම්, උපදේශන නොවන සේවා සහ උපදේශන සේවා මිලදී ගැනීම සඳහා රජයේ ප්‍රසම්පාදන උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමේදී මුදලට උපරිම වටිනාකම (Value for Money), විවෘත හා ඵලදායී තරඟකාරිත්වය, ආචාරධර්ම හා සාධාරණත්වය, විනිවිදභාවය සහ වගවීම තහවුරු කිරීම සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත සහාය ලබාදීම. |
| රාජ්‍ය මුදල් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මුදල් රෙගුලාසි, පසුවිපරම් හා සමාලෝචන) | • රජයේ ප්‍රතිපත්ති අවශ්‍යතා අනුව රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම හා සංවර්ධනය කිරීම.<br>• රජයේ ආයතනවල ගනුදෙනු සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් කාරක සභාව (COPA) විසින් සිදුකරන විමර්ශන සඳහා සහාය ලබාදීම සහ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කිරීම.<br>• අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තා වල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කිරීම.<br>• ගාස්තු සහ අයකිරීම් පිළිබඳ පුළුල් ප්‍රතිපත්තියක් සකස් කිරීම හා සංවර්ධනය කිරීම.<br>• මුදල් රෙගුලාසි අනුව කපාහැරීම් (Write-offs) සහ අත්හැර දැමීම් (Waivers) සඳහා ඉදිරිපත් කරන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.<br>• ශ්‍රී ලංකාවේ විදේශ තානාපති කාර්යාල හා රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල විසින් බදු රහිතව ශ්‍රී ලංකාවට ගෙන එන ලද වාහන විකිණීම හෝ නැවත අපනයනය කිරීමේදී, විදේශ කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රේගුව සහ මෝටර් රථ ලියාපදිංචි කිරීමේ අධිකාරිය සමඟ සම්බන්ධීකරණයෙන් එම වාහන මාරු කිරීම සඳහා උපදෙස් ලබාදීම.<br>• රාජ්‍ය අරමුදල් කළමනාකරණය සම්බන්ධ අධීක්ෂණ හා නිරීක්ෂණ කටයුතු සිදු කිරීම.<br>• දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලන කටයුතු සිදු කිරීම. |

**07.** අමාත්‍යාංශය හැර ඒ යටතේ වන එක් එක් පොදු අධිකාරියෙහි ක්‍රියාකාරකම්වලට අදාළ වන නීති රෙගුලාසි (එක් එක් පොදු අධිකාරියට වෙන වෙනම සටහන් යොදන්න.)

1. පොදු අධිකාරියේ නම :-

| **කාර්යය / කතව්‍යයන්** | **කාර්යයන් / කර්තව්‍යයන් හා සම්මතයන් අඩංගු වන ලිඛිත නීති රෙගුලාසි සඳහන් වන පනත් / රීති / නියෝග / රෙගුලාසි /මාර්ගෝපදේශ / චක්‍ර ලේඛන / අත්පොත් හා වෙනත් වාර්තා ලැයිස්තුව** | **වාර්තාවල තොරතුරු ලබාගත හැකි වෙබ් අඩ විය.** |
|---|---|---|
| | | |
| | | |
| | | |

<u>*තුන්වන කොටස*</u>

08. **අමාත්‍යාංශයට හා එක් එක් පොදු අධිකාරිය වෙනුවෙන් රජයේ අයවැයෙන් / පළාත් සභා මුදල් ප්‍රකාශයෙන් /ස්වයං අයවැය ලේඛන මගින් වෙන් කරන ලද ආදායම් හා වියදම් තොරතුරු**

අමාත්‍යාංශය / පොදු අධිකාරිය නම :-.

8.1 ආදායම් විස්තර

රාජ්‍ය අයවැය/ මුදල් ප්‍රකාශ / ස්වයං අයවැය අනුව (ආදායම් රැස් කරන ආයතන සඳහා පමණි)

| **ප්‍රධාන ආදායම් වර්ගී කරණය** **Revenue Category** | **ඇස්තමේන්තු කළ ආදායම (රුපියල් මිලියන)** | **සත්‍ය වශයෙන් රැස් කළ ආදායම් (රුපියල් මිලියන)** |
|---|---|---|

8.2 වියදම් විස්තර

රාජ්‍ය අයවැය / මුදල් ප්‍රකාශ / ස්වයං අයවැය අනුව

| **ප්‍රධාන වියදම් වර්ගීකරණය** **Category** | **ඇස්තමේන්තු කළ වියදම් (රුපියල් මිලියන)** | **සත්‍ය වශයෙන් වියදම් (රුපියල් මිලියන)** |
|---|---|---|
| ප්‍රාග්ධන වියදම් | 407 | 29.71 |
| පුනරාවර්තන වියදම් | 140 | 55.17 |

8.3 ආදායම් වියදම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු ගාස්තු ගෙවා ලබා ගත හැකි කාර්යාල ලිපිනය හා වෙබ් අඩවිය


09. **අමාත්‍යාංශය හා පොදු අධිකාරින්වල තොරතුරු ලබා ගැනීමට පුරවැසියන්ට සපයා ඇති පහසුකම්.**

| **අමාත්‍යාංශය / පොදු අධිකාරිය නම** | **නිකුත් කර ඇති ප්‍රකාශන** | | | |
|---|---|---|---|---|
| | **වාර්තාව** | **මිළ** | **ලබාගත හැකි කාර්යාල** | **වෙබ් අඩ විය** |
| රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | කාර්‍ය සාධන වාර්තාව | | | www.treasury.gov.lk |
| | | | | |

**10. තොරතුරු නිලධාරීන්ගේ විස්තර ලබා ගත හැකි වෙබ් අඩවි සහ වෙනත් විශේෂ පහසුකම් විස්තර.**

තොරතුරු www.treasury.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

## ORGANIZATIONAL STRUCTURE – DEPARTMENT OF PUBLIC FINANCE




| | | | | | |
|---|---|---|---|---|---|
| **DG** | - | Director General | **ADG** | - | Additional Director General |
| **D** | - | Director | **DD** | - | Deputy Director |
| **AD** | - | Assistant Director | **AO** | - | Administrative Officer |
| **DO** | - | Development Officer | **MSO** | - | Management Service Officer |
| **T** | - | Translator | **KKS** | - | Office Employer Service |